# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVIII — YEAR OF OUR LORD JESUS CHRIST, 2024 SEPTEMBER — Issue No. 10


## ශුද්ධවූ බයිබලය

### (ගීතාවලිය 92:1-10)

01. ස්වාමීන්ට ස්තුතිකිරීමත්, මහෝත්තමයාණෙනි, ඔබගේ නාමයට ප්‍රශංසා ගී කීමත් යහපත.

02. තත් දසයේ වීණාවෙන්ද කුඩා වීණාවෙන්ද මහා වීණාවේ ගරුවූ ශබ්දයෙන්ද

03. උදය ඔබගේ කරුණාගුණයත් සෑම රාත්‍රියේම ඔබගේ විශ්වාසකමත් ප්‍රකාශකිරීම යහපත.

04. මක්නිසාද ස්වාමිනි, ඔබගේ ක්‍රියාවෙන් ඔබ මා සන්තෝෂකළසේක. ඔබගේ හස්තකර්ම ගැන ප්‍රීති ප්‍රකාශ කරන්නෙමි.

05. ස්වාමිනි, ඔබගේ ක්‍රියා කොපමණ මහත්ද! ඔබගේ කල්පනා ඉතා ගැඹුරුය.

06. මේක මෝඩ මනුෂ්‍යයා නොදනියි; අඥානයා තේරුම් නොගනියි;

07. දුෂ්ටයන් තණකොළ මෙන් වැඩෙන්නෙත්, අයුතුකම්කරන සියල්ලන් සඵලවන්නෙත්, ඔවුන් සදාකාලේට විනාශවන පිණිසය.

08. නුමුත් ස්වාමිනි, ඔබ සදාකල්ම උසස්ථානයෙහි වැඩසිටිනසේක.

09. මක්නිසාද ස්වාමිනි, ඔබගේ සතුරෝ, එසේය, ඔබගේ සතුරෝ, විනාශවන්නෝය; අයුතුකම්කරන සියල්ලෝම විසුරුවනු ලබන්නෝය.

10. නුමුත් ඔබ කුළු ගොනාගේ අඟ මෙන් මාගේ අඟ උස්කළසේක; මම අලුරැත් තෙලින් ගාගන සිටිමි.



# ආලේපලත් තැනැත්තාගේ වැරදි පියවර!

## PROTECT YOUR ANOINTING!




ප්‍රධාන කර්තෘ දේවගැති ඇන්ජලීන් සෙල්ව කුමාරි


කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව ලොව පුරාම භාෂා 16 කින් විශ්වාසවන්තව කියවන්නාවූ සෑම දෙනාටම අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් සුභ පතමි. ''*...සිටින්නාවූ, සිටියාවූ මතු සිටින්නාවූ තැනැන්වහන්සේගෙන් ඔබට කරුණාවත් සමාදානයත් වේවා...'' (එළිදරව් 1:4)*

මාගේ ජීවිතයේ සෑම අවස්ථාවකදීම මට මෙම වචනය ධෛර්‍යයක් ගෙන දෙනවා ඇත. එනම්, මාව දන්නාවූ තේරුම් ගත්තාවූ මාගේ අතීතයත් අනාගතයත් දන්නාවූ මා සමඟ ගමන් කරන්නාවූ දෙවියන්වහන්සේ මා සමඟ සිටියි. මේ සහතිකය නිසා මා දෙවියන්වහන්සේට ස්තුති කරමි. මා තුළ තිබෙන ඕනෑම අභියෝගයකට නොබියව මුහුණ දීමට දෙවියන්වහන්සේ මට ශක්තිය දී තිබේ. මගේ ජීවිතය ගැන දෙවියන්වහන්සේට සැලැස්මක් හා අරමුණක් තිබේ. මේ සියල්ල ලෝකය මැවීමට පෙරදීම උන්වහන්සේ මා ගැන තැබුවාවූ සැලැස්මක් බව මා ස්ථිරවම දනිමි. *(එපීස 2:10)*


3 වෙනි පිටුවට ...

# ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

## *from your dearly beloved brother...*

REACHING NATIONS





**OUR MISSION POLICY**

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

HON. EDITOR-IN-CHIEF
Rev. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.
HON. MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
GENERAL MANAGER
Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM., MBA.
ADMINISTRATION
Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)
EDITORIAL BOARD
Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Rev. Dr. K.R. Rajasekaran

EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858 95661 31858
E.MAIL
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com
YOUTUBE CHANNEL
Echo of His Call

**... The Lord will wait, that He may be gracious to you; .... - Isaiah 30:18**

**ක්‍රිස්තුස්වහන්සේ තුළ ප්‍රිය මිත්‍රවරුනි,**

අපගේ ස්වාමිවූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අනර්ඝවූ නාමයෙන් අප ඔබට සුභ පතමි ! ඔබ දන්නා පරිදි චේපාක් වල තිබෙන නෙහෙමියා බයිබල් විද්‍යාල (දමිළ භාෂාවෙන්) සංදෝෂපුරම් (දමිළ භාෂාවෙන්) හා වේලච්චේරි (හින්දි භාෂාවෙන්) පවත්වාගෙන යන්නාවූ බයිබල් විද්‍යාල් වල ඉගැන්වීි 2024 ජූනි මස 3 වන දින නැවත ආරම්භ කිරීම දින නැවත ආරම්භ කිරීම පිණිස අප ඉතා කාර්‍යක්ෂම ලෙස ක්‍රියා කරමින් සිටිමුව.

එසේම 2024 වර්ෂයේ ජූනි මස පළමු වන දින බයිබල් විද්‍යාලේ ඉගෙනීම අවසන් කළ ශිෂ්‍යයින්ගේ උපාධි පිරිනැමීමේ උත්සවය පවත්වන අතර එම උත්සවයෙන් අනතුරුව කිසිදු සභාවක් නොමැති ස්ථාන වල මිෂනාරි සේවය ආරම්භ කිරීම පිණිස මෙම ශිෂ්‍යයින් පිටත් වෙයි. මේ උදෙසා විශේෂයෙන් යාච්ඤා කරන්න.

නෙහෙමියා බයිබල් විද්‍යාලේ හින්දි භාෂාවෙන් දේව වචනය ඉගෙන්වීමට අවශ්‍ය කථිකාචර්‍යවරු M. Div, M. Th, උපාධි ලබා තිබෙන්නාවූ අය අවශ්‍යව ඇත. එසේම හින්දි භාෂාවෙන් ඉගෙන ගන්නාවූ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ද අපට අවශ්‍යව ඇත.

ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් කිතුණු පාසලේ ඉංග්‍රීසි භාෂාවෙන් ඉගෙන ගැනීමට අවශ්‍ය ශිෂ්‍යයින් ලබා දෙන්නය කියාද යාච්ඤා කරන්න. තවද ශුභාරංචිය නොගියාවූ



*Alumni members of Nehemiah Bible College*



*The Graduation Service for the academic year 2023-2024*

Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) BIBLECOR - Postal Courses (3 languages) YouTube Ministry Online Courses Theological Correspondence Courses (2 languages) Church Planting Nehemiah Bible Colleges Gospel Printing Press Great Commission Partners St. Paul's Matriculation School Crusades Community Development

සෑම පලාත්වලටම ගොස් සභාවන් රෝපනය කිරීමටත් සේවය කිරීමටත් බොහෝ අය අපට අවශ්‍ය නිසා ඒ ගැනද යාච්ඤා කරන්න. උපකාර කරන්න.

අප යම් යම් ආත්මික සටන් තුළින් ගමන් කරන නිසා ඒ ගැනද යාච්ඤා කරන්න. අපගේ බොහෝ සේවකයින්ගේ පවුල්වල සාමාජිකයන්ගෙන් සමහරු දරුණු රෝග වලින් පහර ලබා ඇති නිසා මෙය සේවාවන් වලට බොහෝ බාධාවක් වී ඇත. ඒ නිසා ඔවුන්ගේ දිව්‍යමය සුවය උදෙසා යාච්ඤා කරන්න.

ඔබගේ ත්‍යාගශීලී දීමනා තුළින්ද යාච්ඤා තුළින්ද අපව දරාගන්න. අප බොහෝ ආර්ථික ප්‍රශ්න වලට මුහුණ දෙනු ලබන නිසා අපගේ සේවයෙහි යෙදී සිටිනාවූ අයට යවන්නාවූ උපකාරයන් සහ දීමනාවන් යැවීමට ප්‍රමාද වී තිබේ. එබැවින් අප ස්වාමීන්වහන්සේ දෙස බලා සිටිමු. අප ඔබ උදෙසාද යාච්ඤා කරමු.

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**

*Pr. Alex Samson Sam*
*Pr. S. Sam Selva Raj*

(+91) 98412 71858 / 98410 71858,
E.mail : sam@echoofhiscall.org

*1 පිටුවෙන්....*

දෙවියන්වහන්සේ අප එකිනෙකාට විවිධාකාර ලෙස උන්වහන්සේගේ සැලැස්මට මවා තිබේ. අපගේ ජීවිතයෙහි සිදුවෙන්නාවූ සියලු දේ අහම්බෙන් සිදුවෙන්නාවූ දේ නොවෙයි. ඒ සියල්ලම දෙවියන්වහන්සේගේ දිව්‍යමය සැලැස්ම අනුව සිදු වෙයි. ඔබව ලෝකයටත් ඔබගේ දෙමාපියන්ටත් අවශ්‍ය නොමැති පුද්ගලයෙක්ය කියා ඔබ සිතනවා විය හැක. නමුත් දේව වචනය මෙසේ පවසයි. *"මක්නිසාද ඔබ මාගේ හදවත හිමිකරගත්සේක. මාගේ මවු කුසෙහි මා වැසූසේක." (ගීතාවලිය 139:13)* එම නිසා අපගේ ජීවිතය තුල දෙවියන්වහන්සේගේ සැලැස්ම ඉටු කිරීම අපගේ යුතුකමයි. අපට දෙවියන්වහන්සේගේ කරුණාවත් කැඳවීම් ලැබෙන්නේ අපගේ හැකියාව හෝ දක්ෂතාවය මත නොවෙයි. දෙවියන්වහන්සේගේ සැලැස්ම ඉෂ්ඨ කරන පිණිස අපගේ දුර්වලතාවයන් තුළින් සම්පූර්ණ වන පිණිස ස්වාමීන්වහන්සේගේ මාර්ගය තුල ගමන් කිරීමට දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ආත්මය වන ශුද්ධාත්මයාණන්වහන්සේව අපට මඟපෙන්වන පිණිස දී තිබේ.

අපගේ ජීවිතයේ දෙවියන්වහන්සේගේ සැලැස්ම ඉටු නොවන පිණිස අපගේම වැරදි පියවරයන් අපට බාධා වෙයි. ඉශ්‍රායෙල්හි පළමු රජතුමා වූ සාවුල්ගේ ජීවිතයෙහි අප මෙය දකිමු.

***සාවුල් : වැදගත් වන්නේ, අපගේ පටන්ගැන්ම නොව අප අවසාන කරනු ලබන්නේ කෙසේද යන්නයි.***

ඉශ්‍රායෙල් සෙනඟ රජ කෙනෙක් ඉල්ලූ විටදී ඔවුන් ස්වාමීන්වහන්සේව එපා කරමින් උන්වහන්සේගෙන් රජ කෙනෙක් ඉල්ලුවේය. දෙවියන්වහන්සේ ඔවුන්ගේ කැමැත්තට ඉඩදී බෙන්ජමින් පුත්‍රයා වූ සාවුල්ව ඉශ්‍රායෙල්හි පළමු රජ ලෙස ආලේප කරනු ලැබීය. සාවුල්ට ලෝකාකාර ලෙස රජෙක් වීමට අවශ්‍ය සියලු සුදුසුකම් තිබුණි. ඔහු එම රටෙහි සිටි සෑම තැනැත්තන්ටම වඩා උසස් තැනැත්තෙක් බව බයිබලය පවසයි. *"....ඔහු සෙනඟ අතරේ සියලු දෙනාටම වඩා උරහිස පටන් ඉහළට උස්ව සිටියේය." (1 සාමුවෙල් 9:2)* එනම්, තෝරාගත්තාවූ ආලේපය ලැබුවාවූ සියලු හැකියාවන් තිබුණාවූ මෙවැනි පුද්ගලයෙක් ඉතාම දුක්බර වූ අවසානයකට පත් වූයේ ඇයි? එනම්, ඔහුගේ වැරදි පියවර නිසාය.

**1 වන වැරදි පියවර**

**උඩඟුකම !**

දෙවියන්වහන්සේ සාවුල්ව රජකමට කැඳවූ විට ඔහුට ඔහු ගැනම විශ්වාසයක් තිබුනේ නැත. ඔහු පවසනු ලැබූයේ, *"මම ඉශ්‍රායෙල් ගෝත්‍රවලින් ඉතා කුඩා එකක්ව තිබෙන බෙන්ජමින් ගෝත්‍රයේ කෙනෙක් නොවෙම්ද? මාගේ පවුල වනාහී බෙන්යමින් ගෝත්‍රයේ සියළු පවුල් වලින් සුළු එකක් නොවෙද?එසේ නම් ඔබ මෙයාකාර මට කථා කරන්නේ මක්නිසාද?" (1 සාමුවෙල් 9:21)* මේ ආලේපය ලැබූ තැනැත්තා බඩු අතරෙහි සැඟවී සිටියේය. *"....ඔහු බඩු අතරේ සැඟවී ඉන්නවායයි කීසේක." (1 සාමුවෙල් 10:22)* දෙවියන්වහන්සේ අපව කැඳවන විට සෑම දේටම මුහුණදීමට උන්වහන්සේගේ කරුණාව අපට ලබා

දෙයි. සාවුල් ඉශ්‍රායෙල්හි පළමු රජ වන පිණිස දෙවියන්වහන්සේගේ කරුණාව ඔහුට තිබුණි. ඔහුගේ ඉතා යටහත් පහත්වූ ආරම්භය කරණකොට ගෙන දෙවියන්වහන්සේ ඔහුට ආශිර්වාද කලේය. සාවුල් ඔහුගේ ජීවිතයේ සාර්ථකත්වය රසවිඳීමට පටන්ගත්තේය. ජනප්‍රියකම ලබා ගත්තේය. මෙවැනි දේ සිදුවෙන විට ඔහුගේ ඇස් අන්ධ විය. අද බොහෝ අයගේ ජීවිතයෙහි සෑම දේම සාර්ථකව සිදුවෙන විට තමාගේ අතීතය අමතක වෙනු ඇත.

1 සාමුවෙල් 15 වන පරිච්ඡේදයෙහි දෙවියන්වහන්සේ සාවුල්ට අණ කරමින්, ''අමලෙක්වරුන්ගේ සියලුම දේ සම්පූර්ණයෙන්ම විනාශ කරන ලෙසත් කිසිම කෙනෙක්ව ඉතුරු නොකරන්න.'' කියාත් පවසනු ලැබීය. අමලෙක්වරු පටන්ගැන්මේ සිටම ඉශ්‍රායෙල්වරුන්ට විරුද්ධව සිටියේය. දෙවියන්වහන්සේ තෝරාගත්තාවූ අයට විරුද්ධව ඔවුන් මුළුමුනින්ම ක්‍රියා කලේය. එම නිසා දෙවියන්වහන්සේ ඔවුන්ව මුළුමුනින්ම විනාශ කරන ලෙස පවසනු ලැබීය.

**දේව වචනය මෙසේ පවසනු ලැබීය.**

***''....මක්නිසාද නුඹලාට අතගසන්නා උන්වහන්සේගේ ඇසේ කළු ඉංගිරියාවට අතගසන්නේය.'' (සෙකරියා 2:8)***

අමලෙක්වරු දෙවියන්වහන්සේගේ සෙනඟට කල දේ ගැන දෙවියන්වහන්සේ බොහෝ අප්‍රසන්න විය. එම නිසා උන්වහන්සේගේ තම සෙනඟ වෙනුවෙන් අමලෙක්වරුගෙන් පළිගත්තේය. අපට විරුද්ධව තිබෙන සියලු සටන්වලදී අප වෙනුවෙන් සටන් කිරීමට දෙවියන්හන්සේ සිටින බව මතක තබා ගන්න. නුමුත් සාවුල් සම්පූර්ණයෙන්ම වෙනස් දෙයක් කලේය. සාමුවෙල් පැමිණ අමලෙක්වරුන්ව සම්පූර්ණයෙන්ම විනාශ නොකල නිසා සාවුල්ට තරවටු කල විටදී තමා කල පාපයට ඔහු මෙහිදී සමාව ගැනීම කල යුතුව තිබුණු නමුත් ඔහු එහිදී දුන් පිලිතුර නම්, ***''....මම පව්කලෙමි. එහෙත් දැනට මාගේ සෙනඟගේ වැඩිමහල්ලන්ද ඉශ්‍රායෙල්වරුන්ද ඉදිරියේදී මට ගෞරවය දී, මා විසින් ඔබගේ දෙවිවූ ස්වාමීන්වහන්සේට නමස්කාර කරන පිණිස මා සමඟ හැරී ආවමැනව.''*** *(1 සාමුවෙල් 15:30)* සාවුල් මනුෂ්‍යයන්ගේ ගෞරවය ලබා ගන්නා පිනිස ඔහු තුල තිබූ උඩඟුකම නිසා ඔහු යටහත් පහත්ව සිටියේ නැත. මේ නිසා ඔහුගේ සිංහාසනයේ වැඩිමහල් සියලුදෙනාගේ ගෞරවය ලබා ගන්නා පිණිස ඔහු දෙවියන්වහන්සේට අකීකරු වීමට පටන්ගත්තේය. *(1 සාමුවෙල් 15:12)*

බොහෝ අවස්ථාවන් වලදී සාර්ථකත්වය හා ජයග්‍රහණය අපගේ මනසත් ක්‍රියා කලාපයත් වෙනස් කිරීමට පුළුවනි. සාවුල්ගේ ජීවිතය තුල සිදුවූයේ මෙයයි. ඔහු යටහත් පහත් නොවී මනුෂ්‍යයන්ගේ පිළිගැනීමත් ගෞරවයත් සෙවීමට පටන්ගත්තේය. උඩඟුකමේ තිබෙන භයානකත්වය නම් මෙයයි. අප තුළ උඩඟුකම ඇති වන විට දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය අපගේ ජීවිත තුලින් ගනු ලබයි.

අපගේ ජීවිතයට විරුද්ධව ස්වාමීන්වහන්සේ ක්‍රියා කරනවා ඇත. ***''....ඒ නිසා උන්වහන්සේ ඔවුන්ට සතුරෙක් වී, උන්වහන්සේ ම ඔවුන්ට විරුද්ධව යුද්ධ කල සේක.'' (යෙසායා 63:10) ''....දෙවියන්වහන්සේ උඩඟුවූවන්ට විරුද්ධව සිට, යටහතුන්ට කරුණාව දෙන සේක.'' (යාකොබ් 4:6)*** බොහෝ අවස්ථාවන් වලදී අප දෙවියන්වහන්සේගෙන් ලැබූ සෑම දේම අමතක කර ඉතා උඩඟු ලෙස හැසිරෙති. එසේම තවත් බොහෝ අවස්ථාවන් වලට අපට ලැබී තිබෙන්නාවූ දේ ගැන අප පවසනු ලබන්නේ, ''මගේ ගෙදර, මගේ ජීවිතය, මම දන්නවා, හොඳ දේ කුමක්ද කියා මා දන්නවා'' ය කියමින් ඉතා උඩඟුකමින් හැසිරෙති. නමුත් මේ සෑම දෙයක්ම අප දෙවියන්වහන්සේගෙන් ලබා ගත් බව නොසිතති. අපගේ උඩඟුකමට පහර ලබන විටදී අපගේ ඇතුලාන්තයෙහි සිටින සැබෑ මනුෂ්‍යයා පිටතට පැමිණෙයි. එවිට අප ක්‍රියා කරනු ලබන්නේ, ''මා කවුද කියා ඔබ දන්නවාද? ඔබ මට මෙහෙ කථා කරන්නේ කොහොමද?'' කියන වචන අපගේ ඇතුලාන්තය තුන් පිටතට පැමිණෙයි.

අපගේ ආත්මාර්ථකාමී තත්වයට පහර වදින විටදී අප යටහත් පහත් කමින් ක්‍රියා කරනවාද? උඩඟුකමෙන් ක්‍රියා කරනවාද? අප අනවශ්‍ය ලෙස අප තුල තිබෙන උඩඟුකමට ඉඩදෙන විටදී අපට දී තිබෙන ආලේපය අප නැතිකර ගන්නේය.

**2 වන වැරදි පියවර**

**ස්වයං රැවටීම !**

කිසියම් පුද්ගලයෙක් ස්වයං රැවටීමකට හසු වී සිටිනවාය කියා පවසන්නේ,

1. 'තමා වැරදි නැත' කියා ඔවුන් සිතයි
2. තමා සතුව තිබෙන දෙයට වඩා, වැඩි යමක් තිබෙනවාය කියා ඔවුන් සිතයි.
3. ඔවුන් සතුව කිසිවක් නොමැති වුවත් තමාට තිබෙනවාය කියා අන් අයට පෙන්වයි.

....Contd. to page 6

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**සැප්:19-** අපගේ සියලුම උප කර්තෘවරු සහ ඔවුන්ගේ පවුල් වලට කල ආශිර්වාද නිසා ස්තුති කරන්න.

**සැප්:20 -** 1969 වන වසරේ සිට අපගේ සඟරා සේවයට දෙවියන්වහන්සේ කලාවූ අනර්ඝ ආශිර්වාද නිසා ස්තුති කරන්න.

**සැප්:21 -** අපගේ පාලකවරුන්ටත් ප්‍රධාන සහ ශාඛා සභාවලට සිටින්නාවූ සාමාජිකයන්ට කලාවූ ආශිර්වාද නිසා ස්තුති කරන්න.

**සැප්:22 -** අපගේ මුද්‍රණාවල ඉතා ක්‍රමාණුකූලව පවත්වා ගෙන යාමට දෙවියන්වහන්සේ දුන් සේවකයින් නිසා ස්තුති කරන්න.

**සැප්:23-** සංදෝෂපුරම්, බාලාජිනගර් සහ වේලච්චේරි වල පවත්වන ඉරුදින දේව මෙහෙයන් වලට ලබා දුන් අලුත් ඇදහිලිවන්තයින් නිසා දෙවියන්වහන්සේට ස්තුති කරන්න.

**සැප්:24 -** අපගේ ගෝලීමය තරුණ සහ ළමා සුරැකුම් සේවයට කල ආශිර්වාද නිසා දෙවියන්වහන්සේට ස්තුති කරන්න.

**සැප්:25 -** නෙහෙමියා බයිබල් විදුහල සහ ශාන්ත පාවුල් මෙට්‍රිකියුලේෂන් පාසල නිසාත් 2023-2024 වර්ෂය සඳහා මෙහි පැමිණි සියලු අලුත් අය නිසා දෙවියන්වහන්සේට ස්තුත කරන්න.

**සැප්:26-** ධර්මදූත සේවයෙහි යෙදී සිටින්නාවූ අයගේ කැපවීම නිසා දෙවියන්වහන්සේට ස්තුති කරන්න.

**සැප්:27-** නෙහෙමියා බයිබලු විදුහලෙහි නේවාසිකව සිටින්නාවූ ශිෂ්‍යයින් උදෙසා දෙවියන්වහන්සේට ස්තුති කරන්න

**සැප්: 28-** අපගේ YouTube සේවයෙහි විනාඩි 5 කට විකාශනය වෙන්නාවූ පණිවිඩය නිසා දෙවියන්වහන්සේට ස්තුති කරමු.

**සැප්:29-** ශුභාරංචිය නොගිය ස්ථාන වල ශුභාරංචිය ප්‍රකාශ කර නිසා දෙවියන්වහන්සේට ස්තුති කරමු.

**සැප්:30-** අප වෙනුවෙන් යාච්ඤා කරන්නාවූ අය නිසාත් ඇදහිල්ලේ පංගුකාරයින් නිසාත් උපකාර කරන්නාවූ අය නිසාත් දෙවියන්වහන්සේට ස්තුති කරන්න.

**ඔක්:01-** තැපැල් මාර්ගික පාඩම් මාලාව නෙහෙමියා බයිබල් විදුහල ශාන්ත පාවුල් මෙට්‍රිකියුලේෂන් පාසලේ සියලු වැඩසටහන් නිසා දෙවියන්වහන්සේට ස්තුති කරන්න.

**ඔක්:02-** අපගේ ප්‍රධාන සභාවට බොහෝ ඇදහිලිවන්තයින් දුන් නිසා දෙවියන්වහන්සේට ස්තුති කරන්න.

**ඔක්:03-** ශාන්ත පාවුලු මෙට්‍රිකියුලේෂන් පාසලට කැපවූ කිතුණු විදුහල්පති කෙනෙක් හා ගුරුවරු ලබා දුන් නිසා ස්තුති කරන්න

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**ඔක්:04 -** අපගේ ප්‍රධාන පාලක වූ එස්. සැම් සෙල්වරාජ් හා ඔහුගේ පවුලේ සියලු දෙනා සෑම නපුරෙන් ආරක්ෂා කරන්න කියා යාච්ඤා කරන්න.

**ඔක්:05-** ලෝකයේ සිටින සියලු ජනතාව සහ ඔවුන්ගේ අවශ්‍යතාවය නිසා යාච්ඤා කරන්න.

**ඔක්:06 -** අපගේ සේවය සඳහා අවශ්‍ය ආර්ථික අවශ්‍යතා සපයන්න කියා උන්වහන්සේට යාච්ඤා කරන්න.

**ඔක්:07-** අපගේ කාර්ය මණ්ඩලය නිසාත් ඔවුන්ගේ සුවය නිසාත් යාච්ඤා කරන්න.

**ඔක්:08-** ලෝකයෙහි පවතින ආර්ථික අර්බුදය නිසා යාච්ඤා කරන්න.

**ඔක්:09-** සෑම දිනකම උදෑසන 2.00 ට විනාඩි 5 ක් විකාශනය වන්නාවූ YouTube සේවය උදෙසා යාච්ඤා කරන්න.

**ඔක්:10-** පාස්ටර් සෑම් සෙල්වරාජ්ගේ ජීවිත කථාව ලිවීම ධෛර්යමත් වන පිනිස යාච්ඤා කරන්න

**ඔක්:11-** දෙවියන්වහන්සේගේ දරුවන්ගේ ආත්මික සහ ආර්ථික ආශිර්වද නිසා දෙවියන්වහන්සේට ස්තුති කරමු.

**ඔක්:12-** නිවාඩු කාලීන බයිබල් පාසල තුළින් සිය ගණන් දරුවන් යේසුස් වහන්සේව හඳුනා ගන්නා පිණිස යාච්ඤා කරන්න.

**ඔක්:13-** දෙවියන්වහන්සේගේ දරවැන්ට හා මිශනාරිවරුන්ට තිබෙන්නාවූ පීඩා නිසා යාච්ඤා කරන්න.

**ඔක්:14-** දෙවියන්වහන්සේගේ කරුණාව සෑම ජන කොටසකටම වගුරන්න කියා යාච්ඤා කරන්න.

**ඔක්:15-** යක්ෂයාගේ නපුරු ක්‍රියා විනාශ වෙමින් පවුල් කඩා දමන්නාවූ බලවේග නැතිවෙන්න කියා යාච්ඤා කරන්න.

**ඔක්:16-** ලොව පුරා සිටින පීඩනයට හා භයානක රෝග වලට ගොදුරු වූ අය නිසා යාච්ඤා කරන්න.

**ඔක්:17-** මේ මාසය තුලදී අපගේ සියලුම ආර්ථික අවශ්‍යතා දෙවියන්වහන්සේ සපයන්න කියා යාච්ඤා කරන්න.

**ඔක්:18-** නිවාඩු කාලීන බයිබල් පාසල තුළින් ලොව පුරාම ගැලවීම ලබා සිටින්නාවූ ළමා හා තරුණ තරුණියන් උදෙසා යාච්ඤා කරමු.

....Contd. from page 4

***දේව වචනයෙහි මෙසේ පවසයි.***

- ★ *ඔබව උසස් කරමින් නොසිතන්න. (රෝම 11:20)*
- ★ *නුඹලා එකිනෙකා සුදුසු තරමට වඩා තම තමා ගැන උතුම්කොට නොසිතාවා*
- ★ *උඩගුකම ඔබගේ වැටීමට මුලය. (ඔබදියා 1:3)*

සාවුල්ගේ ජීවිතය තුල මේ කාරණා අපට උදාහරණයට ලත හැකිද? ඔහු තුල තිබූ උඩගුකම නිසා ඔහු අන්ධ තත්වයට පත් වී ස්වයං රැවටීමකට ගෙන ගියේය. අප ස්වයං රැවටීමකට වැටුණු විටදී සිදුවන්නේ කුමක්ද?

(A). **දෙවියන්වහන්සේට මුළුමනින්ම කීකරු වීමට අකමැති වීම.**

උදාහරණයක් ලෙස දෙවියන්වහන්සේ සාවුල්ට කථා කරමින් අමලෙක්වරුන්ව සහමුලින්ම විනාශ කරන්නය කියා පවසනු ලැබීය. *(1 **සාමුවෙල්** 15:2)* නමුත් සාවුල් තමුන්වම මුලාවට පත් කර ගනිමින් අමලෙක්වරුන්ගේ හොඳම දේ තබා ගැනීමට තීරණය කරගත්තේය. *(1 **සාමුවෙල්** 15:9)* එනම්, සාවුල් ඔහුම තීරණය කරගනිමින් මේවා තබා ගැනීමට වටිනවාය කියා සිතා අමලෙක්වරුන්ගේ හොඳම දේ තබා ගත්තේය. ඔහුගේ මුලාවීම නිසා ඔහු කල දේ හරිය කියා ඔහු සිතුවේය. එම නිසා ඔහු පවසන්නේ, ***''මම ස්වාමීන්වහන්සේගේ වචනය ඉෂ්ඨකලෙමි.''*** *(1 සාමුවෙල් 15:13)*



***Samuel reprimands Saul for disobeying God's Command***

බොහෝ අවස්ථාවන් වලදී සාවුල් මෙන් අපගේ ක්‍රියාවන්ද අප විසින් ධර්මිශ්ඨ කරනවා ඇත. මන්ද අප මුලාවී සිටින නිසා මෙලෙස කරනු ඇත. දෙවියන්වහන්සේ ප්‍රිය වෙන්නාවූ දේ නොකර අපගේ කැමැත්තට අනුව ක්‍රියා කර අප ස්වයං රැවටීම තුල ජීවත් වෙමු. මේ නිසා දෙවියන්වහන්සේගේ විනිශ්චය අප කෙරෙහි පැමිණෙයි.

(B). **තමාගේ වරද පිළිගැනීමට අකමැති වීම.**



***Saul tries to justify disobedience in a spiritual way***

ඔහුගේ උඩගුකම ස්වයං රැවටීම හා අන්ධ වූ ඇස් නිසා ඔහුගේ හදවත ගල්කරනු ලැබීය. ඔහුගේ කන් බිහිරි විය. ඔහු දෙවියන්වහන්සේගේ හඬට ඇහුම්කන් නොදී ඔහු සෙනඟට දොස් පවරමින්, ***''මා නොවෙයි, දෙවියන්වහන්සේට පූජා කරන පිණිස සෙනඟ හොඳම බැටළුවන් හා ගවයන් බේරා ගත්තා''*** මෙහිදී සාවුල් ඔහුගේ අකීකරුකම ආත්මීකරණය කිරීමට උත්සාහ කලේය. එබැවින්, ***''කීකරුකම පූජාවට වඩා උතුම්ය''*** කියා දෙවියන්වහන්සේ පවසනු ලැබීය. ස්වයං රැවටීම යනු අප කරන වරදෙහි වගකීම අප අන් අයට පැවරීමයි.

(C). **ඔහුව යටහත් කිරීමට අකමැතිවීම**

සාවුල් ඔහුගේ උඩගුකමේ ඉහළම තැනක සිටියේය.

- ★ ඔහු ඔහුටම ස්මාරකයක් සාදා ගත්තේය.
- ★ සාමුවෙල් ඔහුට ගරු කරන්න ඕනිය කියා ඔහු බලාපොරොත්තු වූවේය.
- ★ ඔහු දෙවියන්වහන්සේගේ පිළිගැනීමට වඩා මනුෂ්‍යයන්ගේ ගෞරවය බලාපොරොත්තු විය.
- ★ ඔහු දෙවියන්වහන්සේ ඉදිරියෙහි තමාව යටත් කරගනිමින් සමාව අයදින්නේ නැතිව ඔහු සෙනඟ අතරේ තමාව උසස් කර ගැනීමට වෑයම් කලේය.

අප කරන්නාවූ සෑම ක්‍රියාවකටම විපාකයක් තිබේ.

අඩක් අකීකරුකම අපව සම්පූර්ණ අකීකරුකමට ගෙන යයි.

- ★ සාවුල් ඔහුගේ ක්‍රියාව කරණකොටගෙන දෙවියන්වහන්සේට දුක් දුන්නේය.
- ★ මේ නිසා දෙවියන්වහන්සේ ක්ෂණිකව ක්‍රියා කරමින් ඔහුව එපා කර දැම්මේය.
- ★ දෙවියන්වහන්සේ හා සාමුවෙල් යන දෙදෙනාම සාවුල්ව රජකමට ආලේප කිරීම ගැන දුක්විය.

සාවුල් දෙවියන්වහන්සේගේ කැමැත්තට පිටුපා ඔහුගේ මාර්ගය නැතිකර ගත්තේය. අපගෙන් කිසිවෙක්වත් සාවුල් මෙන් ජීවිතය ගත නොකරන පිණිස යාච්ඤා කරමු.

# 3 වන වැරදි පියවර

## කැරළි ගැසීමය!

සාවුල්ගේ උඩගුකම නිසා ඔහු ස්වයං රැවටීමට යොමු විය. එයින් සිදු වූයේ ඔහු තුල කැරළිගැසීමේ ස්වභාවයක් ඇති වීමයි. කැරළි ගැසීමට සමානව අකීකරු කමද මුරණ්ඩුකමද ප්‍රතිවිපාකයක් ලෙස අපට ඇති වෙයි. ***''බොහෝ වර තරවටු ලැබත් තමාගේ කුළල තදකර ගන්නා ගැලවීමක් නැතුව හදිසියෙන් පොඩි කරනු ලැබේ.'' (හිතෝපදේශ 29:1)*** මේ ආකාරයට විනාශය, කැරළිගසන අය කෙරෙහි පැමිණෙනවා ඇත.

සාවුල්ගේ මෙම කැරළිගැසීමේ ස්වභාවය ඔහුට පමණක් නොව එය මතු පරම්පරාවටත් ප්‍රති විපාකයක් ගෙන දෙන බව ඔහු දැන සිටියේ නැත. ඔහුගේ කැරළිගැසීමේ ආත්මය නිසා ඔහු සාමුවෙල් පැමිණෙන තුරු බලා නොසිට දවන පූජාව ඔප්පු කලේය. එනම්, පූජකයන් විසින් පමණක් ඉටුකල යුතු පූජාව ඔහු කලේය. මේ ගැන ඔහුට තරවටු කරනු ලැබූවත් ඔහු තම සිත දැඩිකර ගත් අතර ඒ ගැන පසුතැවිලි වූයේ නැත. එහි ප්‍රතිඵලය වූයේ සිංහාසනය ඔහුට අහිමි වීමයි. අකීකරුකමේ සියලු ක්‍රියාවන් කැරළිගැසීමත් අපගේ ජීවිතයට ප්‍රති විපාකයත් ගෙන දෙයි.

කැරළිගැසීම යනු තමාට ඉහළින් සිටින නායකත්වයට යටත්වීමට අකමැත්ත ප්‍රකාශ කිරීමත් අපට ඉහළින් බලතල ඇතිව ක්‍රියා කරන අයට අපව යටත් නොකිරීමත්ය. දරුවන් තමාගේ දෙමාපියන්ට යටත් වී කීකරු විය යුතුය. එසේම අපගේ සහකාරයින්ට, වැඩිහිටියන්ට, උසස් නිළධාරීන්ට, සභාවේ නායකයින්ට හා පාලකවරුන්ට අප යටත් විය යුතුය. මේ සෑම දෙයටම වඩා වැදගත් වන්නේ, දෙවියන්වහන්සේට යටත් වීමයි.

කැරළිගැසීම අපගේ හැසිරීම් රටාව නොව එය අපගේ හදවත තුළින් මතුවෙන්නාවූ දෙයකි. එනම් අපගේ හදවත තුළින් වෙනසක් ඇතිවිය යුතුයි.

කැරළිගැසීම ගැන දේව වචනයෙහි ඉතා වැදගත් පාඩමක් අපට උගන්වයි.

***''මක්නිසාද කැරළිකාරකම පේනකීමේ පාපයටත් මුරණ්ඩුකම දේවතාවන් හා රූප ඇදහීමටත් සමානය....'' (1 සාමුවෙල් 15:23)***

''නුමුත් ඒ නිසා උන්වහන්සේ ඔවුන් සතුරෙක් වී, උන්වහන්සේම ඔවුන්ට විරුද්ධව යුද්ධ කල සේක.'' *(යෙසායා 63:10)*

***''.....උන්වහන්සේගේ හස්තය නුඹලාගේ පියවරුන්ට විරුද්ධව තිබුනාක් මෙන් නුඹලාටත් විරුද්ධ වන්නේය.'' (1 සාමුවෙල් 12:14-15)***

පසුතැවිලිවීමට අප අකමැති වුවහොත් දෙවියන්වහන්සේගේ හස්තය අපට විරුද්ධව තිබේ. අපව විනාශය කරා ගෙනයමින් තිබේ.'' ***(1 කොරින්ති 5:5)***

ප්‍රිය මිත්‍රවරුනි, අප අපගේ හදවත ගල්කරගතහොත් අපට වෙනස්වීමට අමාරුකමක් දැනුනොත් මෙම වෙනස සිදුවෙන පිණිස අප ස්වාමීන්වහන්සේගෙන් උපකාරය ලබා ගැනීමට අවශ්‍ය වෙයි. මන්ද දේව වචනයෙහි මෙසේ පවසනු ලබයි. ***''නුමුත් අන්තිමය දක්වා ස්ථිරව සිටින්නාම ගැළවන්නේය.'' (මතෙව් 24:13)***

ප්‍රිය මිත්‍රවරුනි, දෙවියන්වහන්සේ අපට උන්වහන්සේගේ ශුද්ධාත්මයාණන්වහන්සේව, දුන් විට එම ආත්මික වූ දීමනා අපෙන් නැවත ලබා ගන්නේ නැත. එහෙත් උඩගුකම, ස්වයං රැවටීම, කැරළිගැසීම කරණකොට ගෙන ශුද්ධාත්මයාණන්වහන්සේගේ ක්‍රියාවට බාධා වීමට පුළුවනි. දෙවියන්වහන්සේගේ සැලැස්ම තුල ස්ථිරවම සිටින්න. අපව විනාශ කිරීමට ක්‍රියා කරන්නාවූ උඩගුකම වැනි දේ තුළින් අප අපවම නිදහස් කර ගනිමු. අපගේ සියලු වැරදි ස්වාමීන්වහන්සේට කියා දෙමින් උන්වහන්සේගේ සැලැස්ම ඉටුවන පිණිස අපගේ ජීවිතය උන්වහන්සේට කැප කරමු. දෙවියන්වහන්සේගේ කැමැත්ත තුල ජීවත් වීමට අප අධිශ්ඨානය කර ගනිමු.

************


RESIDENTIAL BIBLE COURSE
NEHEMIAH BIBLE COLLEGE, Chennai.

Medium : Hindi/Tamil

Pray for

Recognised by International Christian Leaders & Senior Pastors for the past 54 years

Certificate in Ministry
Diploma in Theology

Rush for Admission!

Qualification : 10th Standard & above

Contact : The Chairman, Nehemiah Bible College.

10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858

* ONLINE CLASSES ARE AVAILABLE *

E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org


....Contd. to page 10



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

**“...කියවන්නා තේරුම් ගනීවා....”** *(මතෙව් 24:15)*

## යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හාස්කමේ දෙවියන්වහන්සේයි !

අපගේ කුඩා උත්සාහයන්ට දෙවියන් වහන්සේ ගරු කරයි.

*‘‘ස්වාමීන්ට ස්තුති කරව්. අපේ පහත් ස්වභාවයෙහිදී අප සිහිකළ උන්වහන්සේට ස්තුත්කරව්. මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල පවත්නේය’’ (ගීතාවලිය 13 : 1-23)*

මගේ ජීවිතයේ සේවයෙහි මුල් කාල වකවානුවේදී දෙවියන්වහන්සේව මහිමයට පත් කිරීමටත්, උන්වහන්සේගේ රාජ්‍ය ව්‍යාප්ත කිරීමටත් කිසිම පුද්ගලික ලාභයක් නොමැතිව ඕනෑම අභියෝගයක් භාර ගැනීමටත් , ඕනෑම ස්ථානයකට යාමටත් හැකි මනසක් දෙවියන්වහන්මේ මට ලබා දුන්නේය. වර්ෂ 1976 - 1986 දක්වා කාල වකවානුවේදී සුභාරංචි රැස්වීම් මාලාවක් සූදානම් කිරීමටත් සුභාරංචිය දේශනා කිරීමටත්, කුඩා රැස්වීම් පැවැත්වීමටත් මා මෙතෙක් කරමින් සිටි රජයේ රැකියාවෙන් විටෙන් විට නිවාඩු ලබා ගත්තෙමි. මේ සෑම දේ සඳහාම මා සතුව තිබූ මුදල් පමණක්ම පාවිච්චි කළෙමි. මාගේ ආත්මික මිත්‍රයින් කීප දෙනෙක්ද ඉන්දියාවේ බොහෝ පළාත්වලට මා සමඟ යන පිණිස දෙවියන්වහන්සේ උදව් කළේය.

මේ අය සමඟ මාස 2ක් පමණ කාලයක් ඉතා දුෂ්කර ගම්මාන වලට ගොස් දස දහස් ගණන් මිනිසුන්ට සුභාරංචිය ප්‍රකාශ කිරීමට දෙවියන්වහන්සේ උපකාර කළේය. බොහෝ අවස්ථාවන් වලදී මේ සේවයේ වියදම් වලටත් අවශ්‍යතාවයන් වලටත් ගමන් ගාස්තු හා නවාතැන් සඳහා දෙවියන්වහන්සේ ඉතා පුදුමාකාර ලෙස අපට උපකාර කළේය.

මෙම සේවය තුළින් ඉතා දුෂ්කර පළාත් එනම්, චෙන්ගල්පට් දිස්ත්‍රික්කය, විල්ලුපුරම් දිස්ත්‍රික්කය, මධුරෛයි දිස්ත්‍රික්කය, තිරුච්චි දිස්ත්‍රික්කය, කන්‍යා කුමාරි දිස්ත්‍රික්කයද කොඩෛයිකානම් උදගමන, තිරුවාන්ද්‍රම්, බැංගලූර්, මෛයිපූර් ආදී විවිධ ස්ථාන වලට ගොස් සේවය කිරීමට දෙවියන්වහන්සේ අපට දොරවල් විවෘත කළේය. අපගේ සංගීත භාණ්ඩ සහ සුභාරංචි පත්‍රිකා ප්‍රවාහනය කිරීමේදී අප විවිධාකාර වූ බාධාවන් වලට මුහුණ දුන්නෙමු. මගේ සේවය සඳහා මා හට ‘වාහනයක් තිබෙන්න ඕනි’ කියාවත් සිතන්න බැරි වාතාවරණයක සිටියෙමි. නමුත් දෙවියන්වහන්සේ මගේ ක්‍රියාකලාපයන් හා මාගේ සාක්ෂිය දුටුවේය. ඔබගේ සේවයේ ඔබ දරණ වෙහෙස මහන්සිය අමතක කර දැමීමට දෙවියන්හන්සේ අධර්මිෂ්ඨ වූ දෙවි කෙනෙක් නොවේ. උන්වහන්සේගේ සේවය සඳහා ඔබ දුන්නු දේත්, උන්වහන්සේගේ සේවකයින්ට ඔබ උපකාර කළ ආකාරයත් දෙවියන්වහන්සේ අමතක කරන්නේ නැත. *(හෙබ්‍රෙව් 6:10)*

පසු කාලයේදී දෙවියන්වහන්සේ මා හා සමඟ සේවයෙහි යෙදී සිටි සෑම කෙනාවම උසස් තත්ත්වයට ගෙන ආවේය. තවමත් උන්වහන්සේ රාජ්‍යය තුළ

**Echo of His Call Postal Courses for candidates in India only**

**Pray for** BIBLECOR

We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate. There will be no compulsory fees. You will be blessed!**

The Chairman, Nehemiah Bible College, Echo of His Call, Post Box 2957, CHEPAUK, CHENNAI - 600 005.
Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in

# MAIN CHURCH PROGRAMMES

1. Prayer Service : 24 hours
2. **ECHO OF HIS CALL** – Monthly Magazines : English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikan.
3. **BIBLECOR** – Basic Bible Courses (English, Tamil & Hindi)
4. Nehemiah Bible Colleges (Three Centres) (Evening / Residential)
5. Theological Correspondence Courses: English & Tamil
6. Great Commission Partners (Network of Pastors)
7. Training Programmes
8. Crusades
9. Literature Distribution and Follow Up
10. Gospel Printing Press – Publications
11. St. Paul's Matriculation School – Village English High School
12. Sunday Schools : 10.30 a.m. & 4.00 p.m. Sunday
13. **Early Morning Service : 5.30 a.m. Sunday**
14. **Tamil Service : 8.30 a.m. Sunday**
15. **Youth Service : 11.00 a.m. Sunday**
16. **Fellowship Lunch : 12.30 p.m. Sunday**
17. **Travel to Mission Centres : 1.30 p.m. Sunday**
18. **Children Ministry : 3.00 p.m. Sunday**
19. **Hindi Service : 4.00 p.m. Sunday**
20. **Telugu Service : 5.00 p.m. Sunday**
21. **Telugu, Hindi & Telugu Service : 6.00 p.m. Sunday**
22. Women's Prayer : 5.30 p.m. Wednesday
23. Men's Prayer : 7.00 p.m. Friday
24. Discipleship Meeting : 6.00 p.m. Saturday
25. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
26. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
27. Ministers' Meeting : 6.00 p.m. First Saturday
28. Parents' Prayer : 4.00 p.m. First Sunday
29. Night Prayer : 9.30 p.m. Third Friday
30. Fasting Prayer : 9:30 a.m. Second Saturday
31. Holy Communion : Second Sunday Services
32. Youth / Kid Prayer : 10.00 p.m. daily
33. Staff Devotion : 9.00 a.m. daily
34. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

දෙවියන්වහන්සේ ඔවුන්ව බලවත් ලෙස පාවිච්චි කරයි. එසේම දෙවියන්වහන්සේ මා හටද සෑම පහසුකමක්ම දී තිබේ. නවීන උපකරණ දී තිබේ. කාර්, වෑන් ආදී වාහනද දී තිබේ. එසේම කැපවීමෙන් සේවය කරන්නා වූ සේවක පිරිසක්ද දී තිබෙන අතර ඉන්දියාවෙහි ජීවත් වෙන්නාවූ බොහෝ සෙනඟට මේ අප සමඟ සේවය කිරීමට මාර්ගයක්ද තිබේ. තවද මා හට ලෝකයේ බොහෝ රටවල් වලට ගොස් සේවය කිරීමටත් උන්වහන්සේගේ කරුණාව ලැබී තිබෙන අතර එම රටවලදී බොහෝ කිතුණු මිත්‍රයින්ට දී තිබේ.

මේ දෙවියන්වහන්සේ තවමත් ජීවමානව සිටියි. කිසිම බලාපොරොත්තුවක් නොමැතිව හා අවංකව සේවය කරන්නා වූ අපව උන්වහන්සේ සොයමින් සිටී. ''ඔබගේ ආහාර ජලය මතුපිටට දමාපන්න, කුමක් හෙයින්ද බොහෝ දවසකට පසු ඒවා නුඹට නැවත සම්බවෙයි'' *(දේශනාකාරයා 11:1)* උන්වහන්සේ කිසිවෙකුට ණය කාරයෙක් නොවේ.

අප ස්වාමීන්වහන්සේට යමක් කිරීමට ආශාවෙන් සිටිනවා නම්, අප එය ක්ෂණිකව කළ යුතුයි. මෙය මාගේ පුද්ගලික ජීවිතය තුළ දැක තිබේ. ''*හුළඟ බලා සිටින්නා නොවපුරන්නේය, වලාකුල් බලන්නා කපා නොගන්නේය'' (දේශනාකාරයා 11:4)* ඔබ දෙවියන්වහන්සේට යමක් කරන විට මේ ලෝකයෙහි සිටින්නා වූ අයත් ඔබ සමඟ සිට ගැනීමට යයි.

මේ කාල වකවානුව තුළ අපගේ සෙනඟ දේව රාජ්‍යය උදෙසා ඔවුන්ගේ මුදල්, තලෙන්ත හා කාලය දීමට කැමති නැත. ඔවුන් බලාපොරොත්තු වන්නේ ක්ෂණික

RNI NO. TN/SIH/2006/17846

## Echo of His Call

**YouTube**

**Please subscribe**

Kindly view and subscribe our **Echo of His Call YouTube Channel** when you get time. Thanks.

**- Editor**

ආශිර්වාද පමණි. ප්‍රිය මිත්‍රවරුනි, මා හට ආශිර්වාද ලැබුණේ උන්වහන්සේගේ සුභාරංචිය මාගේ වාසිය ගැන නොසිතා ප්‍රකාශ කළ නිසාය. සැබවින්ම ඔබට ආශිර්වාද කිරීමට උන්වහන්සේට පුළුවනි. ඔබ අද දවසේදී ඉදිරියට පැමිණ ස්වාමින්වහන්සේ උදෙසා යමක් කරනවාද? ඔබගේ කුරුසිය රැගෙන උන්වහන්සේව අනුගමනය කිරීමට ඔබ සූදානම්ද? ස්වාමින්වහන්සේට තම කැමැත්තෙන්ම සේවය කිරීමටත්, කොතැනකත්, සෑම තැනත්, මොන මිලයක් ගෙවීමට සිදු වුවත් කමක් නැත කියා උන්වහන්සේගේ සේවයට දායකත්වය දෙන අයව උන්වහන්සේ අද බලාපොරොත්තු වෙයි. *"දුර්වලයින් දිනාගන්නා පිණිස දුර්වලයන්ට දුර්වලයෙක් වුණෙමි. සියලු ආකාරයෙන්ම සමහරෙකු ගළවන පිණිස මම සියල්ලන්ට සියල්ල වුණෙමි" (1 කොරින්ති 9:22)*

මේ වචන ඔබ කියවන විට දෙවියන්වහන්සේට ඔබ ගැන සැලැස්මක් තිබෙන බව ඔබ අවබෝධ කරගත යුතුය. මේ ලෝකය තුළින් ලැබෙන වස්තුව සෞඛ්‍ය තත්ත්වය, ලෝකයේ සම්බන්ධතාවයන් හා ජනප්‍රියකම දවසකදී ඔබව රවටනු ඇත. නමුත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබව අත්හරින්නේ නැත. *(යොහාන් 11:18)* අදම ඔබ තීරණයක් ගන්න. ඔබට මහත් විශාල වූ වං විශාල වූ විපාකයක් ලැබෙන්නට තිබේ.

* * * * * * *

## ECHO OF HIS CALL

**Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.**

**Annual Subscription : Rs. 100/-** **Life Subscription : Rs. 2000/-**

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps **(Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.)** to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :

**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India**
**under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
on 2nd **SEPTEMBER 2024.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

**To**

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**